# පුස්තකාල උපයෝජක අධ්‍යාපනය

බෝපැත්තේ සෝමානන්ද හිමි

The secret of rapid development of the world today is, the art of writing. In the age when the writing in media was not developed, ancient people used various things from the environment to express his ideas. The earliest material used to write on was clay. With the invention of paper in China during the Eastern Han period (25–220 AD) by the Chinese Cai Lun and the printing by Gutenberg, the writing medium gained momentam. Thus, with the development of the writing medium, the tendency to generate information has increased. Accordingly, libraries were started as a kind of institution designed with the objective of providing the users with easy access to the rapidly evolving information thought books and other published maturials. As a result, the concept of libraries such as national libraries, university libraries, school libraries, special libraries, research libraries, public libraries, private libraries, virtual libraries, and digital libraries has spread throughout the world. With the establishment of various libraries in this way, a very close relationship was established between the librarians and the users and as a result, the public had the access to these libraries to satisfy their information needs on a daily basis. Here, libraries need to identify the information needs of their users and ensure that their information demand must be supplied to the fullest. Just as the library staff should accurately identify the information needs of the users and they should also provide some guidance to direct the users to fulfill their needs to the fullest. The definition given to this process is “User education”.

පුස්තකාල යනු ක්‍රමිකව විකාශනය වෙමින් පැවතුණ ආයතන විශේෂයකි. ඈත අතීතයේ පොත් ගබඩාවක් ලෙස හැඳින්වූ පුස්තකාල වර්තමානයේ විශාල සමාජ මෙහෙවරක නිරත වේ. පුස්තකාලයේ ඇති සම්පත්වලින් උපරිම සේවයක් ඉටු කිරීම වර්තමානයේ පුස්තකාලවල ප්‍රධාන පරමාර්ථය වන අතර ඒ සඳහා විවිධ ක්‍රම උපායන් යොදා ගනු ලැබේ. උපයෝජක අධ්‍යාපනය හෙවත් පාඨක අධ්‍යාපනය මේ අතර ප්‍රධාන ක්‍රියාවලියකි. මෙම ලිපියෙන් එකී පුස්තකාල පාඨක අධ්‍යාපනය පිළිබඳව සාකච්ඡා කෙරේ. පාඨක අධ්‍යාපනය යන්න නිර්වචන ඇසුරෙන් පැහැදිලි කරමින් ආරම්භ කෙරෙන මෙම ලිපියෙහි උපයෝජන අධ්‍යාපන වැඩසටහන්වල වැදගත්කම හා ඒවායේ අරමුණු දක්වමින් ඉදිරියට ගමන් කරයි. අනතුරුව සාම්ප්‍රදායික හා නූතන උපයෝජක අධ්‍යාපන වැඩසටහන් පිළිබඳව ප්‍රාමාණික විස්තරයක් දක්වා තිබේ. ඒ මගින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ දියුණුවත් සමග උපයෝජක අධ්‍යාපන වැඩසටහන් සංවර්ධනය වී ඇති ආකාරය මනාව හඳුනාගත හැකිය.

ප්‍රමුඛපද-: පුස්තකාලය, උපයෝජක අධ්‍යාපනය, උපයෝජක අධ්‍යාපන වැඩසටහන්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

## හැඳින්වීම

වත්මන් ලෝකයේ වේගවත් සංවර්ධනයේ රහස වන්නේ අක්ෂර ලේඛන කලාවයි. ලේඛන මාධ්‍ය එතරම් නොදියුණු ඈත අතීතයේදී මිනිසා තම සිතෙහි පහළ වන අදහස් ප්‍රකාශ කිරීමට පරිසරයේ විවිධ දේවල් උපයෝගි කරගත්තේය. මුල් යුගයේ මැටිපුවරු ලේඛන මාධ්‍ය වශයෙන් භාවිත කළ අතර චීන ජාතික සායිලුන් විසින් කඩදාසිය සොයා ගැනීමත්, ගුටෙන්බර්ග් විසින් මුද්‍රණ ශිල්පය සොයා ගැනීමත් සමඟ ලේඛන මාධ්‍ය නව මානයකට ගමන් කළේය. ලේඛන මාධ්‍ය දියුණු වීමත් සමග තොරතුරු බිහිවීමේ ප්‍රවණතාව වැඩි විය. ඒ අනුව ශීඝ්‍ර වශයෙන් බිහිවෙන තොරතුරු පාඨකයාට පහසුවෙන් පරිශීලනය කිරිම අවකාශය සලසා දීමේ අරමුණ සහිත ව නිර්මාණය වූ ආයතන විශේෂයක් ලෙස පුස්තකාල ආරම්භ විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ජාතික පුස්තකාල, විශ්වවිද්‍යාල පුස්තකාල, පාසල් පුස්තකාල, විශේෂ පුස්තකාල, පර්යේෂණ පුස්තකාල, මහජන පුස්තකාල, පෞද්ගලික පුස්තකාල, අතත්‍ය පුස්තකාල හා සංඛ්‍යාංක පුස්තකාල වශයෙන් පුස්තකාල සංකල්පය ලෝකය පුරා ව්‍යාප්ත වන්නට විය. මේ ආකාරයට විවිධ පුස්තකාල ආරම්භ වීමත් සමඟ පුස්තකාල හා පාඨක ජනතාව අතර ඉතා සමීප සම්බන්ධතාවක් ගොඩනැගුණු අතර මේ නිසා එදිනෙදා සාමාන්‍ය ජනතාව තම තොරතුරු අවශ්‍යතාවන් සංතෘප්ත කර ගැනීම සඳහා මෙකී පුස්තකාල වෙත ප්‍රවේශ විය. මෙහිදී පුස්තකාල විසින් පාඨක ජනතාවගේ තොරතුරු අවශ්‍යතාව හඳුනාගෙන ඉක්මනින් ඔවුන්ගේ තොරතුරු අවශ්‍යතාව ඉටු කරලීමට වග බලා ගත යුතු වෙයි. එහිදී පාඨකයන්ගේ තොරතුරු අවශ්‍යතාව නිවැරදිව හඳුනාගනිමින් පාඨක අවශ්‍යතාවන් උපරිමයෙන් ඉටුකරගැනීමට ඔවුන් යොමු කිරීම සඳහා යම් උපදේශනයක් ලබා දීමට පුස්තකාල කාර්යමණ්ඩලයට සිදුවේ. මෙම ක්‍රියාවලිය සඳහා ලබා දෙන අර්ථකථනය වන්නේ "පාඨක අධ්‍යාපනය" යන්නයි.

පැරණි යුගයේ පුස්තකාලයන්හි පැවතියේ මුද්‍රිත මූලාශ්‍රය පමණක් වන නිසා කියවන්නා හෙවත් පාඨකයාට ලබා දෙන අධ්‍යාපනය පාඨක අධ්‍යාපනය ලෙස හඳුන්වා දී ඇත. නමුත් වර්තමානය වන විට පුස්තකාල එකතුව මුද්‍රිත මුලාශ්‍රයවලට අමතරව සංගෘහිත තැටි, ශබ්ද පට, වීඩියෝ පට, චිත්‍රපට, යනාදී මුද්‍රිත නොවන තොරතුරු මූලාශ්‍රය මෙන් ම විද්‍යුත් හා සංඛ්‍යාංක තොරතුරු මූලාශ්‍රය ද සමන්විත වීමත්, එසේම අන්තර්ජාලය භාවිතයෙන් සයිබර් අවකාශයේ තොරතුරු වෙත ප්‍රවේශය සලසන අතත්‍ය පුස්තකාල හා සංඛ්‍යාංක පුස්තකාල දක්වා විවිධ තාක්ෂණික වශයෙන් දියුණු පුස්තකාල නිර්මාණය වී තිබීමත්, ජනතාවගේ තොරතුරු අවශ්‍යතාව ද ඉහළ මට්ටමක පැවතීමත් යන කරුණු නිසාවෙන් මුද්‍රිත මුලාශ්‍රයවලට අමතරව විද්‍යුත් මාධ්‍යයන්ගෙන් තොරතුරු වෙත ජනතාව ප්‍රවේශ වන තත්ත්වයක් පුස්තකාල ක්ෂේත්‍රය තුළ නිර්මාණය වී ඇත. මෙකී තත්ත්වය තුළ පුස්තකාලය භාවිත කරන්නන් කියවන්නන් හෙවත් පාඨකයන් ලෙස හැඳින්වීම තවදුරටත් යෝග්‍ය නොවන නිසාවෙන් ඕනෑම මාධ්‍යයක් භාවිත කිරීම යන්නට ගැළපෙන ලෙස උපයෝජක (User) යන පදය භාවිතයට පැමිණ ඇත. (Wilson, 1997)

ඒ අනුව වර්තමානයේ පුස්තකාල හෝ විඥාපන මධ්‍යස්ථානවල පුස්තකාල භාවිත කරන්නන්ට පුස්තකාලය භාවිත කරන ආකාරය පිළිබඳව කරන දැනුවත් භාවය උපයෝජක අධ්‍යාපනය ලෙස හඳුන්වනු ලැබේ. පුස්තකාලයේ ප්‍රශස්ත භාවිතය සඳහා පාඨකයින්ට ආධාර වීම ඉතා සරලව පාඨක අධ්‍යාපනය ලෙස අර්ථකථනය කරනු ලබයි. (Mews, 1972). වෙනත් ආකාරයකට ප්‍රකාශ කළහොත් පාඨක අධ්‍යාපනය යනු පුස්තකාලයක ඇති සීමිත සම්පත් මගින් උපරිම සේවයක් ලබා දීම සඳහා පාඨකයාට අවශ්‍ය කරන පසුබිම සකස් කර දීමයි.

පාඨක අධ්‍යාපනය හෙවත් උපයෝජක අධ්‍යාපනය පිළිබඳ සාකච්ඡා කිරීමේදී උපයෝජක අධ්‍යාපන ක්‍රියාවලිය පිළිබඳව අවධානය යොමු කළ යුතුය. උපයෝජක අධ්‍යාපනය සෑම පුස්තකාලයක් තුළම ක්‍රියාත්මක වන බැවින් උපයොජක අධ්‍යාපන ක්‍රියාවලිය පුස්තකාලයෙන් පුස්තකාලයට වෙනස් වේ. වෙනත් ආකාරයකට ප්‍රකාශ කළහොත් උපයෝජක අධ්‍යාපන ක්‍රියාවලිය පුස්තකාල වර්ගය අනුව විවිධ වේ. ශාස්ත්‍රීය පුස්තකාලයක උපයෝජක අධ්‍යාපනය පිළිබඳ අදහස් දක්වන ජේ. රතෝර් නැමති පුස්තකාලවේදියා උපයෝජක අධ්‍යාපන ක්‍රියාවලියෙහි අදියර තුනක් දක්වා ඇත.

1. පුස්තකාලය පළමු වරට පරිහරණය කරන අයට අධ්‍යයන වර්ෂයක් ආරම්භයේ ලබා දෙන අනුස්ථාපනය.
2. උපයෝජකයන් කිසියම් විෂය ක්ෂේත්‍රයක් ගැඹුරින් හැදෑරීමේ අවස්ථාවකදී එම විෂය දිශානතව ලබා දෙන උපයෝජක අධ්‍යාපනය.
3. පර්යේෂණ කටයුතු සඳහා ලබාදෙන සාහිත්‍ය ගවේෂණ පුහුණුව. (Rathore, 1992, P. 106)

පාඨක අධ්‍යාපනය ඒ ඒ පුස්තකාලයෙන් පුස්තකාලයට ක්‍රියාත්මක කරන ආකාරයෙහි වෙනස්කම් දැකිය හැකි වුවත් එකී පාඨක අධ්‍යාපනය ක්‍රම දෙකකින් සංවිධානය කර ක්‍රියාත්මක කළ හැකි බව Senthur Murugan ප්‍රකාශ කරයි.

1. උපයෝජක අනුස්ථාපනය (Library Orientation)
2. ග්‍රන්ථවිද්‍යාත්මක උපදේශන සේවා (Bibliographic instruction) (Murugan, 2013).

පාඨක අනුස්ථාපන සේවාවෙන් බලාපොරොත්තු වන්නේ අදාළ පුස්තකාලයේ සාමාන්‍ය සැකැස්ම, විවිධ අංශ, විවිධ සේවා සහ කාර්ය මණ්ඩලය පිළිබඳ පාඨකයන්ට හැඳින්වීමක් කිරීමයි. ග්‍රන්ථවිද්‍යාත්මක උපදේශන සේවාවන්හි අරමුණ වන්නේ අදාළ පුස්තකාලයෙන් විවිධ විෂය ක්ෂේත්‍රයන්ට සම්බන්ධව ලබා ගත හැකි තොරතුරු සහ ඒවා ප්‍රයෝජනයට ගන්නා අයුරු පිළිබඳව පාඨකයින්ව දැනුවත් කිරීමයි. පාඨක අධ්‍යාපනය අනුස්ථාපන සේවාවන්හි හා උපදේශක සේවාවන්හි සම්බන්ධතාව සිදුවන අඛණ්ඩ ක්‍රියාවලියකි. පාඨක අධ්‍යාපන ක්‍රියාවලි ඒ ඒ පුස්තකාල විසින් සංවිධානය කර ඇත්තේ මෙම ක්‍රම දෙකෙහි සංකලනයෙනි. නවක පාඨකයින් සඳහා පළමුවෙන්ම කළ යුත්තේ පුස්තකාලය හැඳින්වීම වන අතර ග්‍රන්ථවිද්‍යාත්මක උපදේශක සේවා ක්‍රියාත්මක කළ යුතු වන්නේ දෙවනුවයි.

## උපයෝජක අධ්‍යාපන වැඩසටහන්වල අවශ්‍යතාව

පුස්තකාල පාඨක අධ්‍යාපන වැඩසටහන් කුමක්ද යන්න හඳුනා ගැනීමෙන් අනතුරුව පුස්තකාල පාඨක අධ්‍යාපන වැඩසටහන්වල අවශ්‍යතාව පිළිබඳ කරුණු අවධාරණය කළ යුතු ය. පුස්තකාලයක විවිධ පාඨක අවශ්‍යතා සඳහා පුස්තකාලයට පාඨක අධ්‍යාපන වැඩසටහන් උපකාරී වන බව දක්වයි. උසස් අධ්‍යාපන ආයතන තුළ බොහෝ සිසුන්ට ඔවුන්ගේ පාඨමාලා අන්තර් විෂය බවට පත් වෙමින් පවතින තත්ත්වයක් තුළ ඔවුන්ට පුස්තකාල තොරතුරු මූලාශ්‍රයවලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සඳහා පුස්තකාල පාඨක අධ්‍යාපන වැඩසටහන් අව්‍යශ වේ. (Koenig, 2003, නිකලස් 2003)

තොරතුරු කර්මාන්තයේ වර්ධනයත් සමග ප්‍රකාශන කර්මාන්තයේ ඉතා විශාල වශයෙන් වර්ධනයක් පෙන්නුම් කරන්නට විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් පුස්තකාල ඉතා සංකීර්ණ විය. මේ නිසා පුස්තකාලවල සාහිත්‍ය සංවිධානය කිරීමට සහ එම තොරතුරු බෙදා හැරීම සඳහා පාඨක අධ්‍යාපනය නැමති සංකල්පය පුස්තකාලවලට අවශ්‍ය වේ. විශේෂයෙන් අධ්‍යාපනයේ වේගවත් වෙනස්කම් ඇති කිරීමට ඉගැන්වීම් ක්‍රම පුළුල් කිරීමට, බහු මාධ්‍ය සම්පත් ඉගෙනුම් ක්‍රම වර්ධනය කිරීමට යනාදී පුස්තකාල සම්පත් හඳුන්වා දීම මගින් සියලු වෙනස්කම් සිදු කිරීමට පුස්තකාලවලට පුස්තකාල පාඨක අධ්‍යාපන වැඩසටහන් අව්‍යශවන බව පෙන්වා දිය හැකිය. ෆ්ලෙමින් ප්‍රකාශ කරන ආකාරයට පාඨක අධ්‍යාපනය යනු, පුස්තකාල පාඨකයන්ට වඩාත් ඵලදායි, කාර්යක්ෂම, හා ස්වාධීන ලෙස තොරතුරු මූලාශ්‍රය

පරිශීලනය කිරීම සඳහා ඉගැන්වීම ඉලක්ක කර ගත් වැඩසටහන් ක්‍රමයක් වන අතර තොරතුරු කාර්යක්ෂම ලෙස භාවිතයට ගැනීමට මෙම වැඩසටහන් උපකාරී වේ. මෙම වැඩසටහන්වලින් කුසලතා අවධාරණය කරමින් විවිධ සම්මන්ත්‍රණ, අත්පත්‍රිකා, වැඩමුළු, පාඨමාලා වර්ධනය කිරීමට හැකියාව උදා වී ඇත. මෙම ක්‍රියාවලිය තොරතුරු තාක්ෂණ සාක්ෂරතාව වර්ධනය කිරීමට ප්‍රබල හේතුවක් වේ. පුස්තකාල පාඨක අධ්‍යාපන සංකල්පය සහය ජීවිත හෙවත් ජීවිත කාලීන ඉගෙනුම් ක්‍රියාවලියක් ලෙස අර්ථ කථනය කළ හැකිය. මෙසේ මෙය සහය ජීවිත ඉගෙනුම් ක්‍රියාවලියක් ලෙස හඳුන්වනු ලබන්නේ මෙමගින් ලබන අධ්‍යාපනය මුළු ජීවිත කාලය පුරාවටම එක සේ වැදගත් වන නිසාවෙනි. මෙම ක්‍රියාවලිය බුද්ධි වර්ධන ක්‍රියාවලියක් ලෙස හඳුන්වනු ලබන්නේ එම නිසාවෙනි.

පාඨක අධ්‍යාපන සංකල්පයේ අවශ්‍යතාව පිළිබඳ සාකච්ඡා කරන විට ඒ පිළිබඳ Tiefel ප්‍රකාශ කරන්නේ සමස්ත ලෝකයේ ප්‍රධාන ක්‍රියාව ලෙස තොරතුරු සාක්ෂරතා සංකල්පය හඳුන්වන අතර මෙම තොරතුරු සාක්ෂරතාව සඳහා පාඨකයන් සූදානම් කිරීමට සියලුම වයස් කාණ්ඩවල සිටින අයට ජීවිත කාලය පුරාවටම ඉගැන්වීමට සහ තොරතුරු සෙවීමේ කුසලතාව ඉගැන්වීමට පුස්තකාලයකට අනිවාර්යයෙන් පාඨක අධ්‍යාපන ක්‍රමවේද අවශ්‍ය වන බව ඔහු වැඩි දුරටත් ප්‍රකාශ කරයි.

## උපයෝජක අධ්‍යාපන වැඩසටහන්වල අරමුණු, පරමාර්ථ

Jallbrant විසින් පුස්තකාල භාවිතය වෙනස් වූ ශික්ෂණයක කොටසක් නොවන අතර එහි ප්‍රබල හැකියාවන් අන්තර්ගත බවත්, එයට ශාස්ත්‍රීය අධ්‍යාපන සම්බන්ධයෙන් විවිධ නිර්මාණ කළ හැකි බවත්, විවිධ ශාස්ත්‍රීය පුහුණුවක් තුළ ඉගැන්වීමේ කාර්යය පටිපාටිය සමග පුස්තකාල භාවිත අධ්‍යාපනය සමීප සංඝටනය කරන බවත්, පෙන්වා දී ඇත. ඒ අනුව පහත දැක්වෙන කරුණු පාඨක අධ්‍යාපන වැඩසටහන් සතු අරමුණු ලෙස පෙන්වා දී ඇත.

1. පුස්තකාල සම්බන්ධයෙන් ශිෂ්‍යයන්ට සත්‍ය වශයෙන් දැන ගැනීමට අවශ්‍ය කුමක්ද යන්න පිළිබඳව පුස්තකාලයාධිපතිවරුන්ට අවබෝධයක් ලබා ගැනීම.
2. තොරතුරු ලබා ගැනීමේ අවශ්‍යතාව සඳහා ශිෂ්‍යයා ළඟා වීමට වඩාත්ම කැමති කුමකටද යන්න පිළිබඳව පුස්තකාලයාධිපතිවරුන්ට අවබෝධයක් ලබා ගැනීම.
3. තොරතුරු ලබා ගැනීමේදී පාඨකයන් වඩාත් සමීප වන්නේ කාටද යන්න පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම.

Jallbrant ප්‍රකාශයට අනුව ශිෂ්‍යයන්ට ඔවුන්ගේ ශාස්ත්‍රීය අධ්‍යාපනය සම්බන්ධයෙන් විවිධ මාතෘකා යටතේ තොරතුරු සෙවීම සඳහා ශක්තිය (බලය) ලබා දීම පාඨක අධ්‍යාපන වැඩසටහන්වල ප්‍රධාන අරමුණු සලකා තිබුණ බව තහවුරු කර ඇත. ශිෂ්‍යයන්ට නිදහස්ව සිතීමේ සහ ප්‍රශ්න විසඳීමේ ක්‍රියාකාරකම් සඳහා

ආධාරයක් ලෙස තොරතුරු ලබා ගැනීමට පාඨක අධ්‍යාපන වැඩසටහන්වල තවත් අරමුණක් වන බව ප්‍රකාශ කෙරේ. මීට අමතර වශයෙන් බොහෝ බටහිර විශ්වවිද්‍යාල පැහැදිලි ලෙස නිර්වචනය කරනුයේ පුස්තකාල පාඨක අධ්‍යාපන වැඩසටහන්වල ඉලක්ක සහ අරමුණු ශාස්ත්‍රීය කටයුතු සමග සම්බන්ධ වන බවයි. මේ අනුව අවසාන වශයෙන් පුස්තකාලයෙන් උපරිම ප්‍රතිලාභයක් ලබා ගැනීම සඳහාත්, දීර්ඝ කාලීන පුස්තකාල ප්‍රතිලාභ ලබා ගැනීම සඳහාත්, පුස්තකාලයේ ඇති තමාට අදාළ සෑම ද්‍රව්‍යයක් කරාම පාඨකයාව ළඟා කරවීම සඳහාත්, පුස්තකාල සේවාවලින් පාඨකයාට උපරිම සේවාවක් ලබා දීම සඳහාත්, තොරතුරු ගවේෂණය කිරීමේ හැකියාව ලබා දීම සඳහාත්, දැනුම සහ හැකියාවන් දියුණු කිරීමට අවශ්‍ය කරන අනුබල දීම සඳහාත්, පාඨකයන් සහ පුස්තකාල කාර්යමණ්ඩලය අතර සම්බන්ධතාවය වර්ධනය කිරීම යන සියලුම කරුණු පුස්තකාල පාඨක අධ්‍යාපන වැඩසටහන්වල අරමුණු සහ පරමාර්ථ ලෙස දැක්විය හැකිය.

මෙකී අරමුණු හා පරමාර්ථයන් සහිතව ඒ ඒ පුස්තකාලයවල ක්‍රියාත්මකවන්නා වූ පාඨක අධ්‍යාපනික වැඩසටහන් ප්‍රධාන වශයෙන් ආකාර දෙකකින් හඳුනාගත හැකිය. ඒවා නම්, සාම්ප්‍රදායික පාඨක අධ්‍යාපන වැඩසටහන් සහ නූතන පාඨක අධ්‍යාපන වැඩසටහන් යනුවෙනි. මෙතැන් සිට එකී පාඨක අධ්‍යාපන වැඩසටහන් වර්ග විස්තර කරනු ලැබේ.

## සාම්ප්‍රදායික උපයෝජක අධ්‍යාපන වැඩසටහන්

### 1. දේශන (Lecture)

පුස්තකාලය හඳුන්වා දීමේ වැඩසටහන් අතර ඉතාම ජනප්‍රිය ක්‍රමයක් ලෙස හඳුන්වා දිය හැක්කේ දේශන පැවැත්වීමයි. මෙය එකවර පාඨකයන් කිහිප දෙනෙකුට හෝ විශාල පිරිසකට එකවර පුස්තකාලය පිළිබඳ හඳුන්වා දීමට ඇති හොඳම ක්‍රමය යි. ඒ අනුව පුස්තකාලයේ පවතින සම්පත් හා සේවාවන් පිළිබඳ පාඨකයාව දැනුවත් කිරීම මෙහිදී සිදු කරනු ලබයි. මෙම වැඩසටහන පාඨක අනුස්ථාපන වැඩසටහනකදී නවක පාඨක පිරිසකට පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථානවල ඇති සම්පත් හා සේවාවන් සම්බන්ධව සරල හැඳින්වීමක් කිරීමට ඇති හොඳම ක්‍රමය යි. විශේෂයෙන්ම පුස්තකාලයේ භාවිත කරන වර්ගීකරණ ක්‍රමය, සූචිකරණ ක්‍රමය, රාක්ක වෙත ගොස් පොතක් තෝරා ගන්නා ආකාරය පිළිබඳව, මෙන්ම නොයෙකුත් මාතෘකා පිළිබඳව පාඨකයාව දැනුවත් කිරීම සඳහා මෙම ක්‍රමය යොදා ගත හැකිය. විශේෂයෙන්ම විශ්වවිද්‍යාල පුස්තකාලයක සෑම වර්ෂයක් පාසාම පුස්තකාලයට පැමිණෙන නවක පාඨකයින් සඳහා පුස්තකාලය පරිහරණය කරන ආකාරය පිළිබඳ දැනුවත් කිරීම සඳහා දේශන ක්‍රමය උපයෝගී කරගනු ලබයි. මෙම පුස්තකාල හඳුන්වා දීමේ වැඩසටහන ලෝකයේ විවිධ රටවල පුස්තකාල විසින් පවත්වා ගෙන යනු ලබයි. මේ සඳහා මැන්චෙස්ටාවල පිහිටා ඇති මැන්චෙස්ටා විශ්වවිද්‍යාලය (John Rylands University Library of Manchester) හඳුන්වා දිය හැකිය.

### 2. සම්මන්ත්‍රණ හා වැඩමුළු (Seminas and Workshops)

පාඨක අධ්‍යාපන වැඩසටහන් ලබා දිය හැකි තවත් ප්‍රධාන ක්‍රමයක් වන්නේ සම්මන්ත්‍රණ හා වැඩමුළු පැවැත්වීමයි. පුස්තකාලයට තොරතුරු සොයා පැමිණෙන කුඩා ප්‍රමාණයේ කණ්ඩායම් සඳහා මෙම ක්‍රමය ඉතා යෝග්‍ය වේ. මෙහිදී පුස්තකාලයේ පවතින විවිධ අංශ පිළිබඳව මෙන්ම පුස්තකාලයේ පවතින විවිධ සම්පත් පිළිබඳව පාඨකයාව දැනුවත් කිරීම සඳහා යොදා ගත හැකි සුදුසුම මාර්ගය වේ. මෙම වැඩමුළු පැවැත්වීම එක දවසක් හෝ දින කිහිපයක් වුවද සිදු කළ හැකිය. පාඨකයන් හා පුස්තකාල කාර්යමණ්ඩලය අතර සම්බන්ධතාවක් සම්මන්ත්‍රණ හා වැඩමුළු මගින් ඇතිවේ. කෙසේ වුව ද මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා කාර්යමණ්ඩලය ඉතා විශාල ප්‍රමාණයක් අවශ්‍ය වීම ඉතා අවසිදායක කරුණක් ලෙස මෙහිදී පෙන්වා දිය හැකිය. මෙම වැඩසටහන් හේතු කොටගෙන පාඨකයන් අතර පමණක් නොව පාඨකයන් හා කාර්යමණ්ඩලය අතර සබඳතාව වර්ධනය වීමට මෙය හේතුවක් විය හැකිය. සම්මන්ත්‍රණ සහ වැඩමුළු පවත්වාගෙන යන අන්තර්ජාතික පුස්තකාලයක් වන්නේ Oglethorpe library එකයි. මෙහිදී පුස්තකාල දිශානතිය හඳුන්වා දීම සඳහා පළමු වසරේ සිසුන්ට සම්පත් හා සේවාවන් පිළිබඳව මෙන්ම ඵලදායි පර්යේෂණ උපායමාර්ග පිළිබඳව තොරතුරු ලබා දීම සඳහා සම්මන්ත්‍රණ පවත්වනු ලබයි.

### 3. පුස්තකාල චාරිකා/ සංචාර (Library Tour)

පුස්තකාල චාරිකා යනුවෙන් අදහස් කරන්නේ පුස්තකාල සහ එහි කටයුතු පිළිබඳ පුස්තකාලය තුළ පාඨකයාව රැගෙන යමින් පුස්තකාල සහ එහි කටයුතු පිළිබඳ පාඨකයාට දැනුවත්භාවයක් ලබා දීමයි. මෙම චාරිකාව ලබා දීම සඳහා පාඨකයා තනි තනියෙන් හෝ කණ්ඩායමක් වශයෙන් ලබා දිය හැකිය. පුස්තකාල චාරිකාවල මූලික අරමුණ වන්නේ නව පාඨකයන්ට පුස්තකාලයේ සම්පත්, විවිධ අංශ, සේවාවන් පුස්තකාල මූලාශ්‍රය සහ කාර්යමණ්ඩලය පිළිබඳව අවබෝධයක් ලබා දීමයි. මෙය එක් දිනක් හෝ දින දෙකක පමණ කෙටි චාරිකාවක් වේ. විශ්වවිද්‍යාල පුස්තකාලයක පුස්තකාල චාරිකා විශේෂයයෙන් ලබා දෙනු ලබන්නේ සෑම අධ්‍යයන වර්ෂයක් ආරම්භයේදීම විශ්වවිද්‍යාල පුස්තකාලයට පැමිණෙන නවක සාමාජිකයන්ට වේ. පාඨක අධ්‍යාපන වැඩසටහන් අතර ප්‍රධාන වැඩසටහන් ක්‍රමයක් ලෙස පුස්තකාල සංචාර වන අතර මෙම වැඩසටහන් ක්‍රමය ක්‍රියාත්මක වන පුස්තකාලයකට උදාහරණයක් ලෙස නම් කළ හැක්කේ Chicago විශ්වවිද්‍යාල පුස්තකාලය යි. ඒ අනුව චිකාගෝ විශ්වවිද්‍යාල පුස්තකාලයේ පුහුණු වැඩසටහන් දෙපාර්තමේන්තු හෝ අංශ සඳහා ගැළපෙන ලෙස සකස් කරනු ලබයි.

### 4. ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය (Audio Visual Presentation)

පුස්තකාල සේවා හා සම්පත් පිළිබඳව පාඨකයාට කරුණු ඉදිරිපත් කිරීමේදී වඩාත් ප්‍රබල මාධ්‍යයක් වන්නේ ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යය යි. පාඨකයා වෙත කරුණු ඉදිරිපත් කිරීමේදී එම තොරතුරු කියවීමට ඇසීමට සැලැස්වීමේදී එම කරුණු සිතේ

ධාරණය වී පවතිනුයේ ඒකාකාරී අන්දමට නොවේ. මේ බව සනාථ කරන තොරතුරු ෆියැල්බ්‍රාන්ට් විසින් කර ඇති ගවේෂණයක් මගින් අනාවරණය කොට ඇත. ඒ අනුව කිවීමෙන් 10%ක් ඇසීමෙන් 20%ක් දැකීමෙන් 30% ක් ඇසීමෙන් හා දැකීමන් 50%ක් තමන් විසින්ම ප්‍රකාශ කිරීමෙන් 70% ක් ක්‍රියාකාරීත්වය මගින් අවබෝධය ලැබීමෙන් 90% ක් අන්දමට මතකයේ රැදෙන බවට වාර්තාගතය. (Fialbrant, 1978, p. 47). මේ නිසා ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය භාවිතයෙන් පාඨකයාට නැවුම් සහ නව තොරතුරු සැපයිය හැකිය. පුස්තකාල සම්පත්වල ප්‍රමාණයට අනුව සේයා රාමු දර්ශක ශ්‍රව්‍ය කැසට් පටි වාදන යන්ත්‍ර, වීඩියෝ ආදි මෙවලම් මෙහිදී භාවිත කළ හැකිය.

### 5. පුස්තකාල අත්පොත **(Library hand book)**

පාඨක අධ්‍යාපන වැඩසටහන් යටතේ මුද්‍රිත මාධ්‍ය යටතට ගැනෙන පුස්තකාල අත්පොත යනු පාඨක අධ්‍යාපන වැඩසටහන් සම්බන්ධයෙන් පවතින ප්‍රධාන ලේඛනයකි. ඒ අනුව පුස්තකාල අත්පොත යනු පුස්තකාලය පිළිබඳ තොරතුරු ඇතුළත් කුඩා පොත් පිංචකි. අත්පොතක් යනු අතේ තබා ගත හැකි පරිදි කුඩාවට සකස් කරන ලද ගොඩක් කරුණු ඉතා කෙටියෙන් අන්තර් ගත කොට සකස් කරන ලද පොතකි. මෙම අත්පොත් පුස්තකාල හැඳින්වීම සඳහා ඉතා වැදගත් වේ. පුස්තකාල අත්පොතක පහත දැක්වෙන කරුණු අඩංගු විය යුතු බව රණසිංහ ප්‍රකාශ කරයි. ඒවා නම්, පුස්තකාලයේ නම සහ ලිපිනය, සේවය කරන වේලාවන්, දිනයන්, නිවාඩු දිනයන්, පුස්තකාලය පිළිබඳ සංක්ෂිප්ත හැඳින්වීමක්, පුස්තකාලයේ පරමාර්ථ, පුස්තකාලයේ සංවිධානය, විශේෂ සේවා සහ විශේෂ එකතු, පුස්තකාල සූචිය, පුස්තකාල වර්ගීකරණය, සාමාජිකත්වය සහ අදාළ නීතිරීති, පුස්තකාලයේ කාර්යමණ්ඩලය සහ සේවය කරන අංශ, සිතියම් සහ රූපසටහන් ආදිය වේ. පුස්තකාල අත්පොත නව්‍යතාවෙන් යුක්ත විය යුතු ය.

### 6. පුස්තකාල නියමු පොත් **(Library Guidebooks)**

පාඨක අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී පාඨකයාට පුස්තකාලය පිළිබඳ දැනුවත් කළ හැකි තවත් ක්‍රමවේදයක් වන්නේ පුස්තකාල නියමු පොත ලබා දීමයි. පුස්තකාල අත්පොත තරම් විස්තර ඇතුළත් නොවුණ ද පුස්තකාල නියමු පොතත් ඉතා වැදගත් පාඨක අධ්‍යාපන මාධ්‍යයකි. පුස්තකාල නියමු පොතක පහත කරුණු අඩංගු විය යුතු යැයි රණසිංහ ප්‍රකාශ කරයි. එම කරුණු වන්නේ, පුස්තකාලය පිළිබඳ හැඳින්වීම, ඒ ඒ විෂයන් පිළිබඳ ඇති මූලාශ්‍රය හා සම්පත්, ග්‍රන්ථ විද්‍යාත්මක මූලාශ්‍රය භාවිත කරන ආකාරය, පුස්තකාලය ප්‍රයෝජනයට ගන්නා ආකාරය ආදිය යි.

### 07. තොරතුරු පුවරු **(Notes boards)**

පාඨකයන්ට පුස්තකාලය පිළිබඳ දැනුවත් කිරීමට හා පුස්තකාලයේ පවතින සම්පත් පිළිබඳව දැනුවත් කිරිමට ඇති තවත් එක් සුදුසු මාර්ගය ලෙස තොරතුරු පුවරු මගින් දැක්විය හැකි ය. තොරතුරු පුවරුවල ප්‍රධාන පරමාර්ථය වන්නේ, විවිධ කරුණු අරබයා තොරතුරු ලිපි පුවරු තුළ දැමීමයි. මූලික වශයෙන් පුස්තකාලය තුළ හා ඉන් පිටතදී තොරතුරු පුවරු සවි කළ හැකි ය. පුස්තකාලයට ඇතුල්

වන ස්ථානයෙහි තොරතුරු පුවරු මගින් පුස්තකාලය විවෘතව තබන වෙලාවන් සහ නිවාඩු දිනයන් පිළිබඳ තොරතුරු දිය හැකි ය. ප්‍රධාන සූචිය ආසන්නයෙහි වර්ගීකරණ ක්‍රමය, සූචිපත්‍රිකා පිළියෙල කර ඇති අන්දම සහ පුස්තකාලයෙහි පොත් තැන්පත් කර ඇති ආකාරය තොරතුරු ලබා දිය හැක ය. එසේම පුස්තකාලයට නව පොතක් ප්‍රතිග්‍රහණය කිරීමෙන් පසු එම පොත පිළිබඳ වුවද අවශ්‍ය තොරතුරු සම්පාදනය කළ හැකි ය. එසේම විවිධ උත්සව ආදිය පිළිබඳව ද පාඨකයාව දැනුවත් කිරීම සඳහා විවිධ තොරතුරු ප්‍රදර්ශනය කළ හැකි ය. තොරතුරු පුවරු මගින් අවශ්‍ය කරන පුස්තකාල සම්පත් හා සේවාවන් පිළිබඳ පාඨකයාට ඉක්මනින්ම දැනුවත් කළ හැකිය.

ඉහත දක්වන ලද සෑම ක්‍රමවේදයක් මගින්ම පාඨකයන්ට පුස්තකාලය භාවිත කරන ආකාරය පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබා දිය හැකිය. පොදුවේ සියලු පුස්තකාල භාවිත කරන ක්‍රමවේද මේ යටතේ දක්වන ලද අතර එක් එක් පුස්තකාල වර්ගය අනුව මෙසේ භාවිත කරන පාඨක අධ්‍යාපන වැඩසටහන් විවිධ විය හැකිය. පුස්තකාලයක ඇති සම්පත් හා එහි සේවාවන් පිළිබඳව පාඨකයාව දැනුවත් කිරීම සඳහා මෙසේ අනුගමනය කරන මෙම සියලුම වැඩසටහන් සාම්ප්‍රදායික පුස්තකාල පාඨක අධ්‍යාපන වැඩසටහන් වේ. වර්තමානයේ පුස්තකාලවල දැකිය හැකි විශේෂ ලක්ෂණය වන්නේ තොරතුරු සන්නිවේදන තාක්ෂණය පුස්තකාලවලට ප්‍රවේශ වීමත් සමග පුස්තකලයක සියලුම කටයුතු අන්තර්ජාලය මගින් සිදු කිරීමයි. වෙනත් අයුරකින් ප්‍රකාශ කළහොත් පුස්තකාල කටයුතු කෙරෙහි ඉලෙක්ට්‍රොනික මාධ්‍යය වැඩි වශයෙන් බලපෑමක් ඇති කිරීමයි. ඒ අනුව පුස්තකාලයවල සාම්ප්‍රදායික උපයෝජක අධ්‍යාපන ක්‍රමයන්ට අමතරව වර්තමානයේ මෙම මාධ්‍ය ආශ්‍රය කර ගනිමින් උපයෝජක අධ්‍යාපන ක්‍රම බිහිවී තිබේ. ඒ අනුව පහත සඳහන් වන උපයෝජක අධ්‍යාපන ක්‍රම වර්තමානයේ ජනප්‍රියත්වයට පත්ව ඇති උපයෝජක අධ්‍යාපන වැඩසටහන් ලෙස හඳුන්වා දිය හැකිය.

## නූතන උපයෝජක අධ්‍යාපන වැඩසටහන්

නූතන පාඨක අධ්‍යාපන වැඩසටහන් පිළිබඳ අවධානය යොමු කිරීමේදී වර්තමානයේ පුස්තකාලවලට අන්තර්ජාලය ප්‍රවේශ වීමත් සමග පරිගණකය හා බැඳුණු පාඨක අධ්‍යාපන වැඩසටහන් පවත්වාගෙන යනු ලබයි. ඒ අනුව ඉහත දක්වන ලද සාම්ප්‍රදායික පාඨක අධ්‍යාපන ක්‍රමවේදවලට අමතරව වර්තමානයේ නොයෙකුත් නූතන පාඨක අධ්‍යාපන ක්‍රමවේද අනුගමනය කරනු ලබයි.

### 1. විද්‍යුත් ලිපි සේවය (E-Mail)

පුස්තකාල පාඨක අධ්‍යාපන වැඩසටහන් යටතේ ඉලෙක්ට්‍රොනික මාධ්‍ය උපයෝගිකරගෙන පුස්තකාලයක පාඨකයන්ට ලබා දිය හැකි තවත් පාඨක අධ්‍යාපන වැඩසටහනක් වන්නේ විද්‍යුත් ලිපි සේවයයි. මූල්‍ය ප්‍රතිපාදන සීමිත පුස්තකාලයකට වුවද මෙමගින් ඉතා උසස් පුස්තකාල සේවාවක් ලබා දිය හැකිය. මෙමගින් පාඨකයාට මෙන්ම පුස්තකාලයටද ලැබෙන වාසි රාශියකි. ප්‍රධානම වාසියක් ලෙස

දැක්විය හැක්කේ අවශ්‍ය තොරතුරු අවශ්‍ය වෙලාවට ඉතාමත් කෙටිකාලයක් තුළ අවශ්‍ය කරන පුද්ගලයාට යැවීමට ඇති හැකියාවයි. මෙහිදී අවශ්‍ය කරන තොරතුරු දෘශ්‍ය මාධ්‍යයෙන්, ශ්‍රව්‍ය මාධ්‍යයෙන්, ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයෙන්, ඡායාරූපයක් ලෙස, පෙළක් ලෙස යනාදි වශයෙන් ඕනෑම මාධ්‍යයක් මගින් යැවීමට ඇති හැකියාව නිසා කිසියම් උපයෝජකයකු වෙත උපයෝජක අධ්‍යාපනයට අදාළ සියලුම තොරතුරු විවිධ මාධ්‍යයෙන් එකතු කර ගොනුවක් ලෙස සකස් කර උපයෝජකයාට යැවිය හැකිය. මෙම ක්‍රියාවලියේදී බහු මාධ්‍ය උපයෝගි කර ගන්නා නිසා එක් මාධ්‍යයකින් දේශනයක් වැනි යමක් ලබා දෙනවාට වඩා මෙම ක්‍රමය ඉතා උචිත වේ. මෙහිදී උපයෝජකයන්ගේ ද පුස්තකාල භාවිත කිරීමේ හැකියාව මේ නිසා වර්ධනය වේ. මෙම ක්‍රමය පාඨකයන්ට උපයෝජක අධ්‍යාපනය ලබා දීම සඳහා උචිත ක්‍රමවේදයක් වුවද උපයෝජකයන්ට අන්තර්ජාල සේවාවන් සහ ඒ තුළ විද්‍යුත් ලිපි ගනුදෙනු කිරීමට ඇති හැකියාව හා පරිගණක සාක්ෂරතාව පිළිබඳ මෙහිදී විශේෂ සැලකිල්ලක් අත්‍යවශ්‍ය වේ. මේ නිසා මෙහිදී පාඨකයන්ගේ පරගණක භාවිත කිරීමේ හැකියාව වර්ධනය වේ.

## 2. පුස්තකාල වෙබ් අඩවි (Library Websites)

පුස්තකාලයක ඇති සම්පත් හා සේවාවන් පිළිබඳ පාඨකයාව දැනුවත් කිරීම සඳහා උපයෝජක අධ්‍යාපනය ලබා දිය හැකි තවත් නූතන ක්‍රමවේදයක් වශයෙන් පුස්තකාල වෙබ් අඩවිය මගින් අවශ්‍ය තොරතුරු ලබා දීම දැක්විය හැකිය. පුස්තකාල නිල වෙබ් අඩවිය මගින් උපයෝජකයන්ට අදාළ පුස්තකාලය පිළිබඳ ස්වයං අධ්‍යාපනයකට මග සැලසේ. පුස්තකාලය, පුස්තකාල සම්පත්, පුස්තකාල කාර්යමණ්ඩලය, පුස්තකාල නීති රීති, පුස්තකාල නව වැඩසටහන් ආදි පුස්තකාලය පිළිබඳ සියලුම තොරතුරු ලබා දීමට පුස්තකාල වෙබ් අඩවිය උපයෝගී කර ගත හැකිය. ඒ අනුව විශ්වවිද්‍යාල පුස්තකාලයක නිල වෙබ් අඩවියක් සකස් කර අවශ්‍ය තොරතුරු ප්‍රදර්ශනය කිරීමෙන් කිසිදු කෙනෙකුගේ මග පෙන්වීමකින් තොරව අවශ්‍ය තොරතුරු අවශ්‍ය පුද්ගලයාට අවශ්‍ය තැන සිට ලබා ගැනීමේ හැකියාව පවතී. ඒ අනුව ඕනෑම උපයෝජකයෙකුට ඕනෑම ස්ථානයක සිට ඕනෑම අවස්ථාවක අන්තර්ජාලයට ප්‍රවේශ වී අවශ්‍ය කරුණු පිළිබඳව දැනුවත් වීම මෙහිදී ඉතා වැදගත් වේ. ඒ අනුව නිල පුස්තකාල වෙබ් අඩවිය යනු මාර්ගොපදේශකයකු වැනිය. උපයොජකයන්ට ස්වයං අධ්‍යාපනය සඳහා අවශ්‍ය කරන මාර්ගය මේ මගින් ලැබේ.

## 3. මාර්ගගත සංවාද (Online Chat)

පුස්තකාලයාධිපතිවරයා හෝ තොරතුරු නිලධාරියක සමග මාර්ගගතව සම්බන්ධ වී උපයෝජකයකුට පුස්තකාලයට අදාළ ඕනෑම තොරතුරක් ලබාගත හැකි වීම උපයෝජක අධ්‍යාපනයේ වත්මන් ප්‍රවණතා අතර ඉදිරියෙන් තැබිය හැකි ක්‍රමයක් ලෙස සැලකිය හැකිය. මේ සඳහා උපයෝජකයාගේ පරිගණක සාක්ෂරතාව මෙන්ම අන්තර්ජාලය පිළිබඳ දැනුමද ඉතා අත්‍යවශ්‍ය වේ. ඒ වගේම මේ සඳහා පුස්තකාල කාර්යමණ්ඩලය හෝ පුස්තකාලයාධිපතිවරයා නිරන්තරයෙන් කැප වී සිටීමත් එය කිසියම් ප්‍රමිතිගත බවකින් යුක්තව සිදු කිරීමත් ඉතා අත්‍යවශ්‍ය වේ. මේ සඳහා අන්තර්ජාල සන්නිවේදන සේවා වන ස්කයිප්, යාහු, මැසෙන්ජර් වැනි

මාධ්‍යයක් භාවිත කරමින් ශ්‍රව්‍ය මෙන්ම ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය මගින් උපයෝජකයන්ට සේවා සැලසීම සිදු කළ හැකිය.

### 4. පරිගණක ආශ්‍රිත ඉදිරිපත් කිරීම් (Computer based Presentations)

පරිගණක ආශ්‍රිතව විවිධ මෘදුකාංග භාවිත කරමින් උපයෝජකයන්ට ස්වයං මගපෙන්වීමක් සිදු කළ හැකිය. පුස්තකාලයට ප්‍රවේශ වන ප්‍රධාන ස්ථානයෙහි නිර්මාණය කර තැබීමට මෙම පරිගණක ආශ්‍රිත ඉදිරිපත් කිරීම් ප්‍රයෝජනවත් වේ. මෙහිදී ඔෆිස් පැකේජය (Office Package) භාවිත කරමින් පවර්පොයින්ට් (Powerpoint) වැනි යෙදවුමක් උපයෝගී කරගෙන පුස්තකලයේ සැකැස්ම, තොරතුරු මූලාශ්‍රවල සංයුතිය, නීති රීති ඇතුළු විවිධ මගපෙන්වීම් අන්තර්ගත කොට ස්වයංක්‍රීයව එම තොරතුරු එකම පරිගණක තිරයක නිශ්චිත සැලැස්මකට අනුව සංවිධානය කර තිබීම දක්නට ලැබේ. මෙම ක්‍රමය විද්‍යුත් ලිපි සේවාව හෝ වෙබ් අඩවි ප්‍රකාශයට පත්කිරීමට සාපේක්ෂව අතිශයින් සරල ක්‍රියාවලියක්වන අතර අඩු පිරිවැයකින් සිදු කළ හැකි ක්‍රියාවලියක්ද වේ. මෙම ක්‍රමය උපයෝජක මිත්‍රශීලි බවින් යුක්ත ක්‍රමවේදයක් ලෙස හැඳින්වීම ඉතා නිවැරදි වේ. මෙම ඉදිරිපත් කිරීම් පාඨකයන්ට ආකර්ශනය වන පරිදි රූප, ශබ්ද, චලන හා වර්ණද ආදි නොයෙකුත් ක්‍රම උපායන් භාවිත කිරීම සිදු කරනු ලබයි. පාඨකයින්ට ආකර්ශනය වන පරිදි ඕනෑම භාෂා මාධ්‍යයක් මෙහිදී භාවිත කළ හැකිය.

### 5. චිත්‍රපට (Films)

පාඨක අධ්‍යාපන වැඩසටහන් අතර වර්තමානයේ භාවිත කරනු ලබන ඉතා ජනප්‍රිය ක්‍රමවේදයක් වශයෙන් චිත්‍රපට හඳුන්වා දිය හැකිය. රූප, ශබ්ද, චලන හා වර්ණ යනාදි සියලුම ආකර්ශනීය අංගයන්ගෙන් සමන්විත පුස්තකාල සම්පත් හා සේවාවන් පිළිබඳ ඉතා විශ්වසනීය ලෙස ඉදිරිපත් කිරීමට යොදා ගත හැකි විශිෂ්ට ක්‍රමවේදයක් වශයෙන් මෙම ක්‍රමය නම් කළ හැකිය. චිත්‍රපට මගින් ලබා දෙන තොරතුරු ඉක්මනින්ම පාඨකයාට අවබෝධ කර ගැනීමේ හැකියාව පවතී. ඒ වගේම උපයෝජක අධ්‍යාපනය සඳහා සකස් කරන ලද චිත්‍රපට ඇතුළත් සංගෘහිත තැටි (CD) පුස්තකාලයේ ස්වභාවය අනුව සහ උපයෝජකයන්ගේ ස්වභාවය අනුව පුස්තකාලය මගින්ම පිටපත් කර උපයෝජකයන් අතර බෙදා හැරීමට පුළුවන. මෙසේ බෙදා හරින ලද තැටි පාඨකයාගේ අවශ්‍යතාව මත නරඹමින් පුස්තකාලය පරිහරණය කරන ආකාරය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා ගත හැකිය. එක් වරක් නැරඹීමෙන් පමණක් අවබෝධයක් ලබා ගත නොහැකි වූ විට පාඨක අවශ්‍යතාවය මත නරඹමින් පුස්තකාලයේ පවතින සම්පත් මෙන්ම එම සම්පත්වල භාවිතය පිළිබඳව පාඨකයාට ස්වයංවම අවබෝධයක් ලබා ගත හැකිය. මෙම ක්‍රමය ඉතාමත් අඩු පිරිවැයකින් සිදු කළ හැකි ක්‍රියාවලියකි.

### 6. පරිගණක පාදක උපකාරක දේශන (Computer Assisted Lectures)

සාම්ප්‍රදායික උපයෝජක අධ්‍යාපන ක්‍රමයක් වශයෙන් සලකන දේශන ක්‍රමය තුළ සිදු වන්නේ පුස්තකාලයේ ඇති සම්පත් හා සේවාවන් පිළිබඳ

පාඨකයාට පුස්තකාලයේ කිසියම් පුද්ගලයෙක් විසින් ලබා දෙනු ලබන දේශන මගින් අවබෝධයක් ලබා ගැනීමයි. කිසියම් මාධ්‍යයක් මගින් පාඨකයාට දේශන ලබා දෙන්නේ නම් ඔවුන් ඒවා ග්‍රහණය කර ගන්නා ප්‍රමාණය වැඩි වේ. ඒ අනුව සාම්ප්‍රදායිකව පවත්වාගෙන ආ පාඨක අධ්‍යාපන ක්‍රමයක් වඩ දේශන සඳහා පරිගණක තාක්ෂණය මුසු කිරීම මගින් එම දේශන පාඨකයා අතර වඩාත් ජනප්‍රිය කිරීමට හේතුවන් වේ. මේ නිසා සාර්ථක ලෙස පුස්තකාලය පිළිබඳ අවබෝධයක් පාඨකයාට මෙමගින් ලබා දිය හැකිය. මෙහිදී දේශකයා විසින් ප්‍රකාශ කරන කරුණුවලට අමතරව පරිගණකය පදනම් කරගෙන සිදු කරනු ලබන පැහැදිලි කිරීම් මගින් පාඨකයාට අදාළ තොරතුරු ඉක්මනින් ග්‍රහණය කර ගැනීමේ හැකියාව පවති. පුස්තකාලය පිළිබඳ තොරතුරු මුද්‍රිත හෝ අත්පිටපතක් ලෙස පාඨයාට ලබා දෙනවාට වඩා ප්‍රායෝගිකව ලබා දීමෙන් එම තොරතුරුවල සාධීකාරීත්වය ඉතා ඉහළ මට්ටමක පවති. මෙසේ ප්‍රායෝගිකව තොරතුරු ලබා දීමේදී වීඩියෝ පට, ඡායාරූප හෝ වෙනත් වැඩසටහන් මගින් නිදසුන් ඉදිරිපත් කිරීමේදී පාඨකයාට එම තොරතුරු අවබෝධ වන ප්‍රමාණය ඉතා වැඩිය. මෙම ක්‍රමයේ ඇති ප්‍රධාන අවාසියක් වන්නේ පොදුවේ ඕනෑම ස්ථානයක සිට පැවැත්විය හැකි සරල දේශනයකට වඩා පරිගණක හා අනෙකුත් උපකරණ සම්පාදනය කරගනිමින් දේශනයක් සම්පාදනය කිරීම අපහසු වීමයි.

## සමාලෝචනය

පුස්තකාල වර්ගය අනුව සහ පුස්තකාල සම්පත්වල ස්වභාවය අනුව එක් එක් පුස්තකාල අනුගමනය කරනු ලබන පාඨක අධ්‍යාපන වැඩසටහන් එකිනෙකට වෙනස් වේ. විශේෂයෙන්ම අනෙකුත් පුස්තකාලවලට සාපේක්ෂව විශ්වවිද්‍යාල පුස්තකාල විසින් සාම්ප්‍රදායික උපයෝජක අධ්‍යාපන ක්‍රමවේදවලට අමතරව උපයෝජක අධ්‍යාපනයෙහි මෑත කාලීන ප්‍රවණතා අනුගමනය කරනු ලබයි. මේ අනුව උපයෝජක අධ්‍යාපනය පුස්තකාලය මෙන්ම එය භාවිත කරන උපයෝජකයන්ට වඩාත් ප්‍රයෝජනවත් වන සංකල්පයක් ලෙස හඳුන්වා දිය හැකිය. එසේ වුවත් මෙම උපයෝජක අධ්‍යාපන ක්‍රමවේද භාවිත කිරීමේ හැකියාව එකිනෙක පුස්තකාලයට වෙනස් වේ. එයට හේතු ගණනාවක් ඇත. එක් එක් පුස්තකාලවලට ලැබෙන මූල්‍ය ප්‍රතිපාදන සීමා සහිත වීම සහ කාර්යමණ්ඩලයේ ඇති නොදැනුවත්කම, කාර්යමණ්ඩලය සීමා සහිත වීම, කාර්යමණ්ඩලය මණ්ඩලයේ සහයෝගයක් නොමැතිකම, උපයෝජක අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ඉඩ ප්‍රස්තාවක් නොමැතිකම, උපයෝජකයන්ගේ මේ සඳහා උනන්දුවක් නොමැතිකම යන කරුණු මේ සඳහා බලපා ඇත. කෙසේවෙතත් උපයෝජක අධ්‍යාපන වැඩසටහන් සාර්ථකව ක්‍රියාත්මක කිරීම පාඨකයාට පුස්තකාලය හා එමගින් සපයනු ලබන සේවාවන් පිළිබඳ ප්‍රාමාණික අවබෝධයක් ලබා දීමට නිතැතින් ම උපයුක්තවන නිසා ඒ පිළිබඳ පුස්තකාලයාධිපතිවරුන්ගේ අවධානය දැඩිව යොමු විය යුතුය.

## ආශ්‍රිත ග්‍රන්ථ

රණසිංහ, ආර්. එච්. අයි. එස්. (1997), *පුස්තකාල භාවිතයෙහිලා පාඨක අධ්‍යාපනයෙහි වැදගත්කම සහ ක්‍රියාවලිය*, පුස්තකාල ප්‍රවෘත්ති, ජාතික පුස්තකාලය, කොළඹ.

Gorman, M. (2006), *The wrong path and the right path The role of libraries in access to, and preservation of cultural heritage*. California State University, Fresno, California: USA

Mews, H., (1972), *Reader Instruction in Colleges and Universities*: An Introductory handbooks, London: Bingley

Murugan, Senthur, (2013), *User Education*, Academic Library Aprial 2013:

Rathore, J., (1992), *User Education programmes in academic Libraries*, Lucknow: Lucknow Library press.

Ratnayake, A. R. M. M., (2004), *Library User Education Programmes in Sri Lanka Universities*: An Overview, Journal of the University Librarians

Ratnayake, A. R. M. M., (2002), *Library user Education programmes for Undergraduate Students in Sri Lankan Universities:* Their present Situation Failures and Future Development Requirements, Sri Lanka, University of Colombo (Thisis)

*https://www.smc.edu/AcademicAffairs/Library/Pages/Library-Orientations.aspx*

*http://news.lib.uchicago.edu/blog/2012/09/22/library-orientation-programs-helpnew-students/*

*http://ischool.sjsu.edu/current-students/resources/king-library-orientation*

*http://www.aui.ma/library/library-service/reference-assistance/library-tours-andorientation-programs*